
# අට්ඨමො පාඨො

## සාගරො



සාගරස්ස දස්සනං විනෝදාවහං භවති. ධවලස්සා විය ගච්ඡන්තියො තරඞ්ගමාලායො පවට්ටෙන්ති. තථාපි තරඞ්ගමාලා වෙලං නාතික්කමන්ති. තරඞ්ගමත්ථකෙ ඵේණානි සන්ති. ඵේණානි ධවලානි හොන්ති. තස්මා තරඞ්ගානි ධවලානි හොන්ති. සාගරෙ මච්ඡා ජීවන්ති. තථා කච්ඡපා ච සිප්පී ච වසන්ති. සාගරජලං ඛරරසං භවති. තස්මා සාගරජලස්ස **ඛරොදකන්ති** නාමං භවති. ඛරොදකෙන ලොණං නිබ්බත්තෙති. ලොණං පන ඡන්නං රසානං එකො රසො භවති. ලවණෙන විනා සුපව්‍යඤ්ජනානං කුතො මධුරත්තං. සාගරතො සතතං සීකරං ආවහන්තො සීතවාතො වායති. සමුද්දතීරං විනොදං ජනයති. නානාජනා අනුදිනං සායණ්හෙ තස්මිං සන්නිපතන්ති. සාගරාසන්නගාමවාසිකා කෙවට්ටා මච්ඡෙ හන්ත්වා ජීවිකං කප්පෙන්ති.

(පාලි රචනා 2)

**පදමාලාව**

| | | |
|---|---|---|
| **සාගරස්ස** | - | සාගරයේ |
| **විනෝදාවහං** | - | සතුට ගෙනදෙන |
| **ධවලස්සා** | - | සුදු අශ්වයෝ |
| **තරඞ්ගමාලා** | - | රළපෙළ |
| **පවට්ටෙන්ති** | - | පෙරළෙති |
| **වෙලං** | - | වෙරළ |



නොමිලේ බෙදා හැරීම පිණිසයි

| | | |
|---|---|---|
| **න අතික්කමන්ති** | - | නො ඉක්මවති |
| **මච්ඡා** | - | මත්ස්‍යයෝ |
| **කච්ඡපා** | - | ඉදිබුවෝ |
| **සිප්පී** | - | මුතු බෙල්ලෝ |
| **ඛරරසං** | - | ලුණු රස |
| **ලොණං** | - | ලුණු |
| **ඡන්නං රසානං** | - | සයවැදෑරුම් රස අතරෙන් |
| **මධුරත්තං** | - | මිහිරි බව |
| **කෙවට්ටා** | - | ධීවරයෝ /කෙවුලෝ |
| **ඵෙණානි** | - | පෙණ |
| **ඛරොදකං** | - | කරදිය |
| **නිබ්බත්තෙති** | - | නිපදවයි |
| **සතතං** | - | නිරතුරුව |
| **සීකරං** | - | (පිනිබිඳු) වාතයෙන් විසුරුවන ලද ජලය |
| **සමුද්දතීරං** | - | මුහුදු වෙරළ |
| **අනුදිනං** | - | දිනපතා |
| **සන්නිපතන්ති** | - | රැස්වෙති |

## අභ්‍යාස

**කථං** - කෙසේ
**කිං නු ඛො** - කිම ද
**කානි** - මොනවා
**කීදිසං** - කෙබඳු
**කෙ** - කවරහු
**කිං** - කුමක්
**කෙන** - කුමකින්

1. 'සාගරො' පාඩම සිංහලට නගන්න.
2. පහත දැක්වෙන ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

උදා:- **කෙ මච්ඡෙ හන්ත්වා ජීවන්ති?**
**සාගරාසන්නගාමවාසිකා මච්ඡෙ හන්ත්වා ජීවන්ති**

i. තරඞ්ගමාලායො කථං පවට්ටෙන්ති ?
ii. කිං නු ඛො තරඞ්ගමාලායො වෙලං අතික්කමන්ති?
iii. තරඞ්ගමජ්ඣෙ කානි සන්ති?
iv. සාගරජලං කීදිසං හවති?
v. සාගරෙ කෙ ජීවන්ති, කෙ වසන්ති?

vi. අත්ථි නුඛො සාගරජලස්ස අපරනාමං?
vii. සමුද්දතීරං කිං ජනයති?
viii. කෙවට්ටා කථං ජීවිකං කප්පෙන්ති?
ix. කෙන ලොණං නිබ්බත්තෙන්ති?
x. කිං ත්වං සාගරං දිට්ඨපුබ්බො ?

## අජ්ජතනී ආඛ්‍යාත විභක්තිය

මීට ඉහත පාඩමේ දී වර්තමානකාල හා අනාගතකාල ආඛ්‍යාත විභක්ති දෙක හදාරා ඇත. **වත්තමානා, භවිස්සන්ති** ඒ ආඛ්‍යාත විභක්ති දෙකයි. මෙම පාඩමේ දී අතීතකාල ආඛ්‍යාත විභක්තියක් වන **අජ්ජතනී** සහ කාලයක් නොදක්වන **පඤ්චමී** ආඛ්‍යාත විභක්ති හදාරමු. අද පටන් ආසන්න අතීතකාලයේ ක්‍රියාවක් ප්‍රකාශ කළ යුතු විට **අජ්ජතනී** ආඛ්‍යාතය භාවිත කෙරේ.

**අජ්ජතනී පරස්සපද ප්‍රත්‍යය මාලාව**
**(ඊ, උං, ඔ, ත්ථ, ඉං, ම්හා)**

| | එකවචන | | | බහුවචන | | |
|---|---|---|---|---|---|---|
| පුරිස | සර්වනාමය | ප්‍රත්‍යය | ආඛ්‍යාත පදය | සර්වනාමය | ප්‍රත්‍යය | ආඛ්‍යාත පදය |
| පඨම | සො | ඉ<br>ඊ | අපචි, පචි<br>අපචී, පචී<br>(පිසුවේය) | තෙ | උං,<br>ඉංසු | අපචුං,<br>පචුං<br>අපචිංසු,<br>පචිංසු<br>(පිසූහ) |
| මජ්ඣිම | ත්වං | ඔ | අපචො,<br>පචො<br>(පිසුවෙහි) | තුම්හෙ | ත්ථ | අපචිත්ථ,<br>පචිත්ථ<br>(පිසුවෙහු) |
| උත්තම | අහං | ඉං | අපචිං, පචිං<br>(පිසුවෙමි) | මයං | ම්හ,<br>ම්හා | අපචිම්හ,<br>පචිම්හ,<br>අපචිම්හා,<br>පචිම්හා<br>(පිසුවෙමු) |

## අජ්ජතනී අත්තනොපද ප්‍රත්‍යය මාලාව
(ආ, ඌ, සෙ, වහං, අ, මෙහ)

| | ඒකවචන | | | බහුවචන | | |
|---|---|---|---|---|---|---|
| පුරිස | සර්වනාමය | ප්‍රත්‍යය | ආඛ්‍යාත පදය | සර්වනාමය | ප්‍රත්‍යය | ආඛ්‍යාත පදය |
| පඨම | සො | ආ | අපචා, පචා (පිසුවේය) | තෙ | ඌ | අපචූ, පචූ (පිසුවෝය) |
| මජ්ඣිම | ත්වං | සෙ | අපචිසෙ, පචිසෙ (පිසුවෙහි) | තුම්හෙ | වහං | අපචිවහං, පචිවහං (පිසුවෙහු) |
| උත්තම | අහං | අ | අපච, පච (පිසුවෙමි) | මයං | මෙහ | අපචිමෙහ, පචිමෙහ (පිසුවෙමු) |

පහත දැක්වෙන වගු හොඳින් නිරීක්ෂණය කරන්න.

### අජ්ජතනී පරස්සපද

| පඨම පුරිස | | මජ්ඣිම පුරිස | | උත්තම පුරිස | |
|---|---|---|---|---|---|
| ඒකවචන | බහුවචන | ඒකවචන | බහුවචන | ඒකවචන | බහුවචන |
| අධාවී,ධාවී අධාවි,ධාවි | අධාවිංසු, ධාවිංසු | අධාවො, ධාවො | අධාවිත්ථ, ධාවිත්ථ | අධාවිං, ධාවිං | අධාවිම්හ, ධාවිම්හ ධාවිම්හා, ධාවිම්හා |
| අඛාදී,ඛාදී අඛාදි,ඛාදි | අඛාදිංසු, ඛාදිංසු | අඛාදො, ඛාදො | අඛාදිත්ථ, ඛාදිත්ථ | අඛාදිං, ඛාදිං | අඛාදිම්හ, ඛාදිම්හ අඛාදිම්හා, ඛාදිම්හා |

| | | | | | |
|---|---|---|---|---|---|
| අභවී,භවී<br>අභවි,භවි | අභවිංසු,<br>භවිංසු | අභවො,<br>භවො | අභවිත්ථ,<br>භවිත්ථ | අභවිං,<br>භවිං | අභවිම්හ,<br>භවිම්හ<br>අභවිම්හා,<br>භවිම්හා |
| අවන්දී,වන්දී<br>අවන්දි,වන්දි | අවන්දිංසු,<br>වන්දිංසු | අවන්දො,<br>වන්දො | අවන්දිත්ථ,<br>වන්දිත්ථ | අවන්දිං,<br>වන්දිං | අවන්දිම්හ,<br>වන්දිම්හ<br>අවන්දිම්හා,<br>වන්දිම්හා |

## අජ්ජතනී අත්තනොපද

| පඨම පුරිස | | මජ්ඣිම පුරිස | | උත්තම පුරිස | |
|---|---|---|---|---|---|
| එකවචන | බහුවචන | එකවචන | බහුවචන | එකවචන | බහුවචන |
| අභවා,<br>භවා | අභවුං,<br>භවුං | අභවිසෙ,<br>භවිසෙ | අභවිව්හං,<br>භවිව්හං | අභව, භව | අභවිම්හෙ<br>භවිම්හෙ |
| අචරා,<br>චරා | අචරුං,<br>චරුං | අචරිසෙ,<br>චරිසෙ | අචරිව්හං,<br>චරිව්හං | අචර, චර | අචරිම්හෙ<br>චරිම්හෙ |
| අකිණා,<br>කිණා | අකිණුං,<br>කිණුං | අකිණිසෙ,<br>කිණිසෙ | අකිණිව්හං,<br>කිණිව්හං | අකිණ,<br>කිණ | අකිණිම්හෙ<br>කිණිම්හෙ |
| අඩසා,<br>ඩසා | අඩසුං,<br>ඩසුං | අඩසිසෙ,<br>ඩසසෙ | අඩසිව්හං,<br>ඩසිව්හං | අඩස,<br>ඩස | අඩසිම්හෙ<br>ඩසිම්හෙ |
| අගමා,<br>ගමා | අගමුං,<br>ගමුං | අගමිසෙ,<br>ගමිසෙ | අගමිව්හං,<br>ගමිව්හං | අගම,<br>ගම | අගමිම්හෙ<br>ගමිම්හෙ |

## පඤ්චමී ආඛ්‍යාත විභක්තිය

අණකිරීමක් හෝ ආශිර්වාදයක් පැවසීමට **පඤ්චමී** ආඛ්‍යාත විභක්තිය යොදා ගැනේ. එම නිසා එව, යව, තබවු යනාදී විධානයක් හෝ වේවා!, කෙරේවා!, සිටීවා යනාදී ආශිර්වාදයක් හෝ ප්‍රාර්ථනාවක් කළයුතු කල්හි පඤ්චමී ආඛ්‍යාත විභක්තිය භාවිත කෙරේ.

**පඤ්චමී ආඛ්‍යාත පරස්සපද ප්‍රත්‍යය මාලාව**
**(තු, අන්තු, හි, ථ, මි, ම)**

| | එකවචන | | | බහුවචන | | |
|---|---|---|---|---|---|---|
| පුරිස | සර්වනාමය | ප්‍රත්‍යය | ආඛ්‍යාත පදය | සර්වනාමය | ප්‍රත්‍යය | ආඛ්‍යාත පදය |
| පඨම | සො | තු | පචතු (වේවා) | තෙ | අන්තු | පචන්තු (වෙත්වා) |
| මජ්ඣිම | ත්වං | හි | පච, පචාහි (වෙහිවා) | තුම්හෙ | ථ | පචථ (වෙහුවා) |
| උත්තම | අහං | මි | පචාමි (වෙම්වා) | මයං | ම | පචාම (වෙමුවා) |

**පඤ්චමී අත්තනොපද ප්‍රත්‍යය මාලාව**
**(තං, අන්තං, ස්සු, වෙහො, එ, ආමසෙ)**

| | එකවචන | | | බහුවචන | | |
|---|---|---|---|---|---|---|
| පුරිස | සර්වනාමය | ප්‍රත්‍යය | ආඛ්‍යාත පදය | සර්වනාමය | ප්‍රත්‍යය | ආඛ්‍යාත පදය |
| පඨම | සො | තං | පචතං | තෙ | අන්තං | පචන්තං |
| මජ්ඣිම | ත්වං | ස්සු | පචස්සු | තුම්හෙ | වෙහො | පචවෙහො |
| උත්තම | අහං | එ | පචෙ | මයං | ආමසෙ | පචාමසෙ |

පහත දැක්වෙන වගු හොඳින් නිරීක්ෂණය කරන්න.

**පඤ්චමී පරස්සපද**

| පඨම පුරිස | | මජ්ඣිම පුරිස | | උත්තම පුරිස | |
|---|---|---|---|---|---|
| එකවචන | බහුවචන | එකවචන | බහුවචන | එකවචන | බහුවචන |
| ගච්ඡතු | ගච්ඡන්තු | ගච්ඡ/ගච්ඡාහි | ගච්ඡථ | ගච්ඡාමි | ගච්ඡාම |
| භවතු | භවන්තු | භව/භවාහි | භවථ | භවාමි | භවාම |
| වසතු | වසන්තු | වස/වසාහි | වසථ | වසාමි | වසාම |
| ධාවතු | ධාවන්තු | ධාව/ධාවාහි | ධාවථ | ධාවාමි | ධාවාම |
| ලිඛතු | ලිඛන්තු | ලිඛ/ලිඛාහි | ලිඛථ | ලිඛාමි | ලිඛාම |

**පඤ්චමී අත්තනොපද**

| පඨම පුරිස | | මජ්ඣිම පුරිස | | උත්තම පුරිස | |
|---|---|---|---|---|---|
| එකවචන | බහුවචන | එකවචන | බහුවචන | එකවචන | බහුවචන |
| ගච්ඡතං | ගච්ඡන්තං | ගච්ඡස්සු | ගච්ඡවෙහො | ගච්ඡෙ | ගච්ඡාමසෙ |
| භවතං | භවන්තං | භවස්සු | භවවෙහො | භවෙ | භවාමසෙ |
| වසතං | වසන්තං | වසස්සු | වසවෙහො | වසෙ | වසාමසෙ |
| ධාවතං | ධාවන්තං | ධාවස්සු | ධාවවෙහො | ධාවෙ | ධාවාමසෙ |
| ලිඛතං | ලිඛන්තං | ලිඛස්සු | ලිඛවෙහො | ලිඛෙ | ලිඛාමසෙ |

**අභ්‍යාස**

1. පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. අජ්ජතනී ආඛ්‍යාතයෙන් කියවෙන්නේ කිනම් කාලය ද ?

ii. ගච්ඡතු, දදන්තු, වදාහි, කරොථ, ලභාමි, වසාම යන පඤ්චමී ආඛ්‍යාත විභක්ති පද යොදා වාක්‍ය හයක් සාදන්න.

iii. අජ්ජතනී හා පඤ්චමී ආඛ්‍යාත විස්තර කෙරෙන බාලාවතාර පාඨ සොයා ලියන්න.

iv. √භූ (භව) ධාතුව පඤ්චමී පරස්සපදයෙහි වරනගා, එහි තේරුම ලියන්න.

v. √හර ධාතුව අජ්ජතනී පරස්සපදයෙහි වරනගා, එහි තේරුම ලියන්න.



නොමිලේ බෙදා හැරීම පිණිසයි

2. 'සාගරෝ' පාඨයෙන් ආඛ්‍යාත පද දහයක් උපුටා දක්වා පහත වගුව සම්පූර්ණ කරන්න.

| ආඛ්‍යාත පදය | පඤ්චමී ආඛ්‍යාතය | | අජ්ජතනී ආඛ්‍යාතය | |
|---|---|---|---|---|
| | එකවචන | බහුවචන | එකවචන | බහුවචන |
| 1.භවති | භවතු | භවන්තු | අභවී, භවී | අභවිංසු, භවිංසු |
| 2. | | | | |
| 3. | | | | |
| 4. | | | | |
| 5. | | | | |
| 6. | | | | |
| 7. | | | | |
| 8. | | | | |
| 9. | | | | |
| 10. | | | | |

3. √කර ධාතුව අජ්ජතනී ආඛ්‍යාත උභය පදයේත්, √චර ධාතුව පඤ්චමී ආඛ්‍යාත උභය පදයේත් වරනඟා දක්වන්න.

4. පහත දැක්වෙන වගු සම්පූර්ණ කරන්න.

1 වගුව

| ධාතුව | පඨම පුරිස | | මජ්ඣිම පුරිස | | උත්තම පුරිස | |
|---|---|---|---|---|---|---|
| | එකවචන | බහුවචන | එකවචන | බහුවචන | එකවචන | බහුවචන |
| √පච | පචතු | | පච, පචාහි | | | පචාම |
| √චර | | චරන්තු | | චරථ | චරාමි | |
| √භජ | | | භජ, භජාහි | | | |
| √තර | | | | තරථ | | |
| √හර | | | | | | |

## 2 වගුව

| ධාතුව | පඨම පුරිස | | මජ්ඣිම පුරිස | | උත්තම පුරිස | |
|---|---|---|---|---|---|---|
| | එකවචන | බහුවචන | එකවචන | බහුවචන | එකවචන | බහුවචන |
| √පච | අපචී,පචී<br>අපචි,පචි | | අපචො,<br>පචො | | අපචිං,<br>පචිං | |
| √චර | | අචරිංසු,<br>චරිංසු | | අචරිත්ථ,<br>චරිත්ථ | චරාමි | අචරිම්හා,<br>චරිම්හා<br>අචරිම්හ,<br>චරිම්හ |
| √භජ | | | | | | |
| √තර | | | | තරථ | | |
| √හර | | | | | | |

5. පහත වාක්‍ය සිංහලට නගන්න.
i. පියදාසො පාණිනා මණිං ගණ්හි.
ii. තුම්හෙ අතිථීනං ආහාරං අදිත්ථ.
iii. යාචකස්ස භරියා මග්ගෙ ධාවි.
iv. සිස්සා පරිවෙණං පීඨානි හරිංසු.
v. අහං දීපම්හි සබ්බත්ථ (සියලු තැන්හි) අචරිං.

6. පහත වාක්‍ය පාලියට නගන්න.
i. සොරා කඩුවකින් මිතුරාට ගැසුවේ ය.
ii. වෙළෙන්දෝ ගමෙන් ගමට ගියාහුය.
iii. මම දිනපතා සවස මුහුදු වෙරළට ගියෙමි.
iv. සොරු රජුගේ වාහනය සොරකම් කළහ.
v. අපි සාගරයේ රළ දුටුවෙමු.

**න තං කම්මං කතං සාධු, යං කත්වා අනුතප්පති**

**පසුතැවිලිවීමට සිදුවන පව්කම් නොකිරීම මැනවි.**

(ධම්මපදපාළි, බාලවග්ග, 8 ගාථාව)